**කෑගල්ල නගර සභාව - 2021**

**-----------------------------------**

1 මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

කෑගල්ල නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කෑගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

----------------------------------------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රීඩා හා උපකරණ යටතේ ගිණුම්ගත විය යුතු රු. 1,875,000ක් ලී බඩු සහ සවිකිරීම් යටතේ ගිණුම්ගතවීම නිවැරදි කිරීමේදී යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුමට බැර කිරීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා ලී බඩු හා උපකරණ ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි. | ගිණුම් තැබීමේ දී අතපසුවීමකින් සිදුවී ඇති බවත්, 2022 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඇති බවත් දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කලයුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පළාත් සභා කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු රු. 3,628,504ක් ණය හිමියන් ලෙස ගිණුම්ගතකර නොතිබුණ අතර, ඉන් රු. 3,005,385ක් 2021 වර්ෂය වෙනුවෙන්ද, රු. 623,119ක් පෙර වර්ෂය වෙනුවෙන්ද, වූ බැවින් පිළිවෙලින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් තැබීමේ දී අතපසුවීමකින් සිදුවී ඇති බවත්, 2022 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඇති බවත් දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කලයුතුයි. |
| (ඇ) | ඔරලෝසු කණුව අසල නව වෙළඳ සංකීර්ණය අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. 8,643,120 ක් වුවද, එය රු. 9,391,616ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා රු. 748,496කින් වර්ෂයේ වියදම වැඩියෙන් දක්වා තිබුණි. | මෙය අලුත්වැඩියා කිරීමේ කාර්යයක් බැවින් එය කරගෙන යාමේදී අවශ්‍යතාවය මත ගෙවීම් සංශෝධනය වීමද සිදුවිය හැකි බවත්, එය කර්මාන්තයේ ඇස්තමේන්තු මුදල ඉක්මවා නොයන බැවින් ඇස්තමේන්තු මුදල ගිණුම් ගත කර ඇති බවත් දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කලයුතුයි. |

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අතැති තොග ගිණුමේ, මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂය අතර රු. 6,035,864ක වෙනසක් පැවතුණි. | පෙන්වා දී ඇති වෙනස පරීක්ෂා කරනු ලබන අතර නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | වෙනස්කම් හඳුනාගෙන ශේෂ නිවැරදි කිරීමට කටයුතු කලයුතුයි. |

1.6.3 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොරෝනා වසංගතය හේතුවෙන් ආදායම් විෂයයන් 11 ක රු. 10,794,081ක ආදායම්, සමාලෝචිත වර්ෂයේදී සභා අනුමැතිය මත කපා හැර තිබුණද, ඒ සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2021 අගෝස්තු 12 හා 2021 සැප්තැම්බර් 29 දින රැස්වූ මහා සභාවේදී ගනු ලැබූ තීරණය පරිදි මෙම කුලී ගාස්තු අයකර නොගැනීමට තීරණය කර ඇති බව දන්වා තිබුණි. | කපා හැරීම් සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගතයුතුයි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.81,741,931 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 71,627,845 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම් හා බදු | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට පෞද්ගලික අංශයට අයත් වරිපනම් ඒකක 3670 කින් අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු. 3,215,693ක් වූ අතර, ඉන් රු. 1,660,455 ක් සමාලෝචිත වර්ෂයට අදාල වන අතර, කාලය නිශ්චිතව හඳුනාගත නොහැකි ඉතිරි රු. 1,555,238 ක ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ කොවිඩ් වසංගතය හේතුවෙන් මානුෂික හේතුන් මත දේපල තහනම් කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකරන ලද බව දන්වා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කලයුතුය. |